## 285 සුරලොව දෙව්ඳුට

සුරලොව දෙව්ඳුට මහිමය හිමි වේවා
දනාට මිහි මත සාමය හිමි වේවා.
දෙව් හිමි පාණෙනි සුර රජිඳාණනි පුත්බල දෙව්ඳුපියේ
අපි ඔබ නමදිමු තුති දෙමු පසසමු ඔබේ මහිමය සඳහා
ජේසු ක්‍රිස්තු හිමි පියතුමගේ හුදු දරුවූ
දෙව් හිමියෙනි දෙව්ඳුගේ බිළි යාගෙනි
ලෝ පව් දුරලනුයේ ඔබය.
අප වෙත කරුණා කළ මැනව්
හිඳිතිය ඔබ පියතුමගේ දකුණේ
අප ඇයැදුම පිළි ගත මැනව්
හුදු ඔබ පමණිය සුදු වනුයේ
ඔබ පමණිය සමිඳා
ඔබ පමණිය හුදු අති උතුමා.
ජේසු ක්‍රිස්තු සුදු සුසුමන් හා
දෙව් පියතුමගේ මහිමේ වැඩ හිඳිනා. ආමෙන්.